**ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන (පුද්ගලික) සමාගම - 2016**

---------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 සමාගම පිහිටුවීම**

-------------------

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන (පුද්ගලික) සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද වගකීමෙන් සීමිත රාජ්‍ය සමාගමක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කර ඇත. මෙහි ශ්‍රී ලංකා වරාය අධිකාරියට සියයට 40 ක් හා ශ්‍රී ලංකා නැව් සංස්ථාවට සියයට 15 ක කොටස් හිමිකමක් ඇත.

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

2012 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතුව පවතින ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් රු. 5,901,323 ක් හා සේවක වන්දි රු. 1,013,472 ක් අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) විගණන මතයේ පදනම ,විෂය පථය හා විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් මවිසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණය මඟින් පෙනීයන පරිදි සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) වරාය අධිකාරිය සමඟ සමාගම 2016 සැප්තැම්බර් 15 දින එළඹ තිබූ ගාලු මුවදොර පිටිය පරිපාලනය නඩත්තුව හා කළමනාකරණය සඳහා වූ ගිවිසුමෙහි 9 වන වගන්තිය | ගිවිසුම් කාලය තුළ එක් එක් වර්ෂය අවසාන වී ඊළඟ වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර සමාගම විසින් වරාය අධිකාරිය වෙත වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ලිඛිත වාර්තාවක් එහි විගණකයන් හරහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යසාධන වාර්තා කාලීනව සමාලෝචනය කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 5.1.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කළයුතු වුවත්, සමාගම විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 7.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යවසායක් විසින්ම ප්‍රධාන මෙහෙයුම් සියල්ල ආවරණය වන පරිදි, මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System ) පිළියෙල කළ යුතු වුවත්, සමාගම එවැනි මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. |
| (iv) 7.4.2. වගන්තිය | ආයතනයේ පරිපාලන, මෙහෙයුම් හා අනෙකුත් ගැටළු සම්බන්ධ තීරණ ගැනීම හා ඒ පිළිබඳ පසු විපරම් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින 05 කට පෙර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටු රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දී ඉහත කමිටු රැස්වී නොතිබුණි. |
| (v) 7.4.5. වගන්තිය | ආයතනය සතු ස්ථාවර වත්කම් සහ තොග සත්‍යාපනය කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද ආයතනය සතු පිරිවැය රු. 6,039,966 ක් වූ ස්ථාවර වත්කම් සහ රු.384,128 ක තොග සමාලෝචිත වර්ෂය අවසානයේ දී සත්‍යාපනය කර නොතිබුණි. |
| (vi) 8.8 වගන්තිය | ආයතනය වර්ෂය ආරම්භයේ දීම වියදම් සීමාවන් දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය සහිතව මූල්‍ය අධිකාරිය පවරාදීමක් සිදුකළ යුතු වුවත්, සමාගම සමාලෝචිත වර්ෂය සඳහා ඉහත පරිදි මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. |
| (vii) 7.4.1 වගන්තිය හා 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (1) වගන්තිය | විගණන කමිටුව අවම වශයෙන් මාස 03 කට වරක් රැස් වී සිය නිරීක්ෂණ සහ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදිය යුතු වුවත්, සමාගම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,062,371 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.3,011,085 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,051,286 කින් හෙවත් සියයට 301ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

ශ්‍රී ලංකා වරාය පරිශ්‍රයෙන් පිටත පිහිටි වරායට අයත් මුහුදු සීමාවට පැමිණෙන නැව් ස්ථානගත කිරීම් පහසුකම් සැපයීම, නැව් බඩු පැටවීම් ගොඩබෑම් ආශ්‍රිත පරිවාස සේවා සැපයීම, උපකරණ සැපයීම අදාල අවස්ථාවලදී වරාය රථවාහන තදබදය පාලනය විධිමත් කිරීම මෙන්ම වාප්පු කටයුතු, ගුදම් කටයුතු ඉටුකිරීම එම කටයුතු සඳහා ගාස්තු අයකිරීම හා ඒවා පිළිබඳ වාර්තා පවත්වා ගැනීමට අදාල සියලු කටයුතු සම්බන්ධ මෙහෙයුම් හා පරිපාලන කටයුතු භාරගැනීම අධීක්ෂණය හා පාලනය ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සමාගමේ ප්‍රධාන අරමුණු වේ.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින් සියළු තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් (Schemes of Recruitment) සකසා ඊට රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන ඊට අනුකූලව තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකළ යුතු වුවද එවැනි බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව ආයතනය සඳහා නිලධාරීන් 12 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

--------------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උප වගන්තිය ප්‍රකාරව සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළ සමාගමේ අරමුණු හා ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳ කළමනාකරණයේ වගකීම පැහැදිලි වන අයුරින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධානයන් අනුව ආයතනයේ අභ්‍යන්තර පාලනය හා අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ පරීක්ෂාවක් පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

අයවැය ලේඛනයක් සකස් කර කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගත යුතු වුවද, ආයතනය සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.